# 09. ආයතනයක ගිණුම් වාර්තා අසම්පූර්ණ වන විට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

(9.1) අසම්පූර්ණ සටහන් පැහැදිලි කිරීම.

ව්‍යාපාර ආයතනයක ගිණුම් තැබීම සඳහා අනුගමනය කරන පිළිගත් ක්‍රමය වන්නේ ද්විත්ව සටහන් ක්‍රමයයි. එහිදී සෑම ගනුදෙනුවක්ම හර හා බැර වශයෙන් ගිණුම් දෙකක ඇතුළත් කෙරේ. නමුත් ද්විත්ව සටහන් ක්‍රමය සම්පූර්ණයෙන්ම අනුගමනය නොකර පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුම් සටහනක් අසම්පූර්ණ වාර්තා (Incomplete records) ලෙස හැඳින්වේ.

සුළු පරිමාණ ව්‍යාපාර ආයතන බොහෝ විට මෙම ක්‍රමය මත වාර්තා පවත්වා ගන්නා අතර මෙම ක්‍රමය තනි සටහන් (Single entry) ක්‍රමය ලෙසට හඳුන්වයි. ඇතැම් ව්‍යාපාර මුදල් පොත ද, ණය ගැතියන්ගේ වාර්තා සහ ණය හිමියන්ගේ වාර්තා පමණක් බොහෝ විට තබාගන්නා නමුත් දෛනිකව සිදුවන අනෙකුත් ගනුදෙනු සඳහා අසම්පූර්ණව තබාගන්නා අවස්ථා දක්නට ලැබේ. කෙසේ නමුත් අසම්පූර්ණ වාර්තා තබා ගැනීමට පහත හේතු බලපෑ හැකිය.

- ද්විත්ව සටහන් ක්‍රමය පිළිබඳ අවබෝධයක් නැතිවීම.
- ද්විත්ව සටහන් ක්‍රමයට ගිණුම් වාර්තා පවත්වා ගැනීම සුළු ව්‍යාපාරයන්ට ප්‍රායෝගික නොවීම.
- ඒ සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීම.
- ගිණුම් වාර්තා මනා ලෙස පවත්වාගෙන යාමට මැලිකමක් දැක්වීම.

අසම්පූර්ණ වාර්තා පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයෙකුට ඇතිවන අවාසි සිසුන් සමඟ සාකච්ඡා කිරීම.

(9.1) අසම්පූර්ණ වාර්තා ද්විත්ව සටහන් බවට පත් කරමින් මූල්‍ය ප්‍රකාශන පිළිලෙ කිරීම.

අසම්පූර්ණ වාර්තා පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ආයතනයක කිසියම් කාලච්ඡේදයක මෙහෙයුම් ප්‍රතිඵලය (ලාභය/අලාභය) ගණනය කිරීමට පහත ක්‍රම අනුගමනය කළ හැකිය.

I. ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය, කාලච්ඡේදයේ අවසන් ප්‍රාග්ධනය සමඟ සැසඳීම.
II. පවත්නා දත්ත මත පදනම්ව අවසාන ගිණුම් සඳහා අවශ්‍ය තොරතුරු ලබාගනිමින් ඒවා ද්විත්ව සටහන් ක්‍රමයට වාර්තා කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.

ව්‍යාපාරයක ප්‍රාග්ධනය සැලකිල්ලට ගනිමින් පහත පරිදි මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කළ හැකිය. මෙහිදී අප මූලික ගිණුම් ශිල්ප ක්‍රම භාවිතයට ගත හැක.

ශුද්ධ ලාභය/ අලාභය = අවසන් දිනට ප්‍රාග්ධනය − ආරම්භක දිනට ප්‍රාග්ධනය

සහ

කාලච්ඡේදය අතර අමතර ප්‍රාග්ධනය යෙදවීමක් හෝ ආපසු ගැනීමක් සිදුව ඇති අවස්ථාවක

ශුද්ධ ලාභය / අලාභය = අවසන් දිනට ප්‍රාග්ධනය + ආරම්භක දිනට ප්‍රාග්ධනය + ගැනිලි − යෙදූ අමතර ප්‍රාග්ධනය

- නිශ්චිත දිනකට ව්‍යාපාර ආයතනයක ප්‍රාග්ධනය ගණනය කිරීමට තත්ව ප්‍රකාශයක් පහත පරිදි පිළියෙල කරගත හැක.

| | |
|---|---|
| නිශ්චිත දිනට ව්‍යාපාරයේ ඇති ජංගම හා ජංගම නොවන වත්කම්වල වටිනාකම | xxxxx |
| නිශ්චිත දිනට ව්‍යාපාරයේ ඇති ජංගම හා ජංගම නොවන වගකීම්වල වටිනාකම | (xxxx) |
| නිශ්චිත දිනට ප්‍රාග්ධනය | xxxx |

නිදසුන් 01

කසුන්ගේ ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් පිළිබඳ තොරතුරු ඔබට සපයයි.

| | 2019.01.01 දිනට (රු.) | 2019.12.31 දිනට (රු.) |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 500 000 | 650 000 |
| මෝටර් රථ | 400 000 | 350 000 |
| බඩු තොගය | 80 000 | 60 000 |
| ණය ගැතියෝ | 100 000 | 120 000 |
| සුළු මුදල් ශේෂය | 50 000 | 80 000 |
| ණය හිමියෝ | 25 000 | 30 000 |
| බැංකු අයිරාව | 5 000 | 15 000 |

වර්ෂය තුළදී කසුන් විසින් රු. 12 000 ක් සිය පුද්ගලික වියදමට ලබාගෙන ඇති අතර ඔහු විසින් 2019.06.20 දින රු. 100 000 ක අමතර ප්‍රාග්ධනයක් ව්‍යාපාරයට යොදවා ඇත.

අවශ්‍ය වන්නේ 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කසුන්ගේ ව්‍යාපාරයේ ලාභය/අලාභය ගණනය කිරීම ?

විසඳුම : (සිසුන් සමග සාකච්ඡා කරමින් ක්‍රියාකාරකමේ නිරත වීම)

2019.01.01 දිනට සහ 2019.12.31 දිනට ප්‍රාග්ධනය ගණනය කිරීම.

| | 2019.01.01 දිනට | 2019.12.31 දිනට |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | ................................................. | ................................................. |
| මෝටර් රථ | ................................................. | ................................................. |
| බඩු තොගය | ................................................. | ................................................. |
| ණයගැතියෝ | ................................................. | ................................................. |
| සුළු මුදල් ශේෂය | ................................................. | ................................................. |
| මුළු වත්කම් | ................................................. | ................................................. |
| අඩු කළා :- | | |
| ණය හිමියෝ | (.................................................) | (.................................................) |
| බැංකු අයිරාව | (.................................................) | (.................................................) |
| ප්‍රාග්ධනය (ශුද්ධ වත්කම්) | ................................................. | ................................................. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| කාලච්ඡේදයේ ලාභය / අලාභය | = | 2019.12.31 දිනට ප්‍රාග්ධනය ......................... | − | 2019.01.01 දිනට ප්‍රාග්ධනය ........................ | + | කාලච්ඡේදයේ ගැනිලි ....................... | − | අමතර ප්‍රාග්ධනය ........................ |

- පවත්නා දත්ත මත පදකම්ව තොරතුරු ලබාගෙන ඒවා ද්විත්ව සටහන් බවට පත්කරමින් මූල්‍ය ප්‍රකාශන පහත පරිදි පිළියෙල කළ හැක. එහිදී සාමාන්‍යයෙන් අනුගමනය කළ හැකි පියවර කීපයක් පහත දැක්වේ.

I. ආරම්භක ප්‍රාග්ධනය ගණනය කිරීම.
මෙහිදී ගිණුම් වර්ෂය ආරම්භයේ ඇති ශුද්ධ වත්කම් තත්ත්ව ප්‍රකාශනයක් ආශ්‍රයෙන් සොයා ගත හැකිය.

II. විකුණුම් නිශ්චය කිරීම.
මෙහිදී මුළු විකුණුම් ගණනය සඳහා ණය ගැති පාලක ගිණුමක් මඟින් ණයට විකුණුම් ද මුදල් පාලන ගිණුම ආශ්‍රයෙන් අත්පිට විකුණුම් සොයා ගැනීම.

III. ගැනුම් නිශ්චය කිරීම.
මේ සඳහා සඳහා ද මුළු ගැනුම් ගණනය සඳහා ණය හිමි පාලන ගිණුමක් මඟින් ණයට ගැනුම් ද මුදල් පාලන ගිණුම ආශ්‍රයෙන් අත්පිට ගැනුම් ද සොයා ගැනීමට හැකිය.

IV. මුදල්/ බැංකු ශේෂය නිශ්චය කිරීම.
මේ සඳහා බැංකු ප්‍රකාශන, බැංකු පාස් පොත උපයෝගී කරගනිමින් මුදල් / බැංකු ශේෂ ගණනය කළ හැක.

V. කාලච්ඡේදයේ ආදායම් / වියදම් නිශ්චය කිරීම.
මේ සඳහා මුදල් පාලන ගිණුමෙන් හෙළිවන ආදායම් සහ වියදම් ද උපචිත වියදම්, කලින් ගෙවූ වියදම් මෙන්ම උපචිත ආදායම් සහ කලින් ලද ආදායම් ඇත්නම් ඒවා අදාල ගිණුම් තුළට ගැලපීමෙන් පසු එම ගිණුම් ශේෂ නිශ්චය කරගත හැක.

VI. ස්ථාවර වත්කම් ගිණුම්වල ශේෂ නිශ්චය කිරීම.
මෙහිදී පහත කරුණු කෙරේ අවධානය යොමු කරමින් එම ගිණුම්වලට අදාල ගැලපීම් කර ගත යුතුය.

(a) ගිණුම් කාලච්ඡේදය ආරම්භයේ තිබූ වත්කම් ගිණුම්වල ශේෂ
(b) මුදල් පාලන ගිණුමෙන් හෙළිවන වත්කම් මිලට ගැනුම් සහ විකුණුම් අගයන්
(c) ස්ථාවර වත්කම්වලට අදාල ක්ෂය වීම්

VII. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
ඉහත ගිණුම් වලින් සොයාගත් තොරතුරු ඇසුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ හැක.

නිදසුන් 02 ඃ-

ද්විත්ව සටහන් ක්‍රමයට වාර්තා පවත්වා නොගත් සයිමන් පෙරේරා මහතාගේ ව්‍යාපාරයට අදාල තොරතුරු පහත දැක්වේ.

1. ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් (රු. 000)

| | 2018.04.01 | 2019.03.31 |
|---|---|---|
| ස්ථාවර වත්කම් | 30 000 | 38 000 |
| ඉතිරි තොග | 12 000 | 16 000 |
| ණය ගැතියෝ (වෙළෙඳ) | 8 000 | 15 000 |
| ණය හිමියෝ (වෙළෙඳ) | 14 000 | 18 000 |
| බැංකු ශේෂය | 4 000 | (3 000) |

2. වර්ෂය තුළ ව්‍යාපාරය මිලට ගෙන ඇති ස්ථාවර වත්කම් වල අගය රු. 11000,000 කි.
3. ව්‍යාපාරයේ වාර්තා වලට අනුව දළ මෙහෙයුම් වියදම් රු. 16 500 000 පමණ ගෙවා ඇත.
4. වර්ෂය තුළ සයිමන් විසින් රු. 5 000 000 ක මුදලක් ප්‍රාග්ධනය ලෙස යොදා ඇති අතර ඔහුගේ ගැනිලි රු. 8 000 000 කි.
5. වර්ෂය තුළ ණය ගැතියන්ගෙන් රු. 97 900 000 ක් මුදලින් එකතු කරගෙන ඇත. ණය හිමියන්ට ඉන් රු. 70 400 000 ක් ගෙවා ඇත.
6. වර්ෂය තුළ ණය ගැතියන්ට දුන් වට්ටම් රු. 1 500 000 ක් ද ණය හිමි ලද වට්ටම් රු. 1 000 000 ක් ද බොල් ණය රු. 700 000 ක් සිදුව ඇත.
7. ව්‍යාපාරය සියලුම ගෙවීම් චෙක්පත් මඟින් සිදුකර ඇත.

ඉහත තොරතුරු ඇසුරින් ව්‍යාපාරයේ

I. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
II. 2019.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය පිළියෙල කරන්න.

විසඳුම ඃ-

2018.04.01 දිනට ප්‍රාග්ධනය ගණනය කිරීම.

| තත්ව ප්‍රකාශනය | රු. 000 |
|---|---|
| ස්ථාවර වත්කම් | 30 000 |
| ඉතිරි තොගය | 12 000 |
| ණය ගැතියෝ | 8 000 |
| බැංකු ශේෂය | 4 000 |
| | 54 000 |
| අඩු කළා | |
| ණය හිමියෝ | ( 14 000 ) |
| 2018.04.01 ට ප්‍රාග්ධනය | 40 000 |

මුදල් පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේ | 4000 | ස්ථාවර වත්කම් | 11000 |
| ප්‍රාග්ධනය | 5000 | මෙහෙයුම් වියදම් | 16500 |
| ණයගැති | 97900 | ගැනිලි | 8000 |
| | | ණයහිමි | 70400 |
| | | වෙනත් වියදම් | 4000 |
| ප/ගෙ/ශේ | 3000 | | |
| | 109900 | | 109900 |

### ස්ථාවර වත්කම් ගිණුම

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේ | 30000 | ස්ථාවර වත්කම් | 3000 |
| මුදල් | 11000 | | |
| | | ප/ගෙ/ශේ | 38000 |
| | 41000 | | 41000 |

### ණය ගැති පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේ | 8000 | මුදල් | 97900 |
| | | දුන් වට්ටම් | 1500 |
| විකුණුම් | 107100 | බොල් ණය | 700 |
| | | ප/ගෙ/ශේ | 15000 |
| | 115100 | | 115100 |

### ණය හිමි පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| මුදල් | 70400 | ස්ථාවර වත්කම් | 14 000 |
| ලද වට්ටම් | 1000 | | |
| | | ගැනුම් | 75400 |
| ප/ගෙ/ශේ | 18000 | | |
| | 89400 | | 89400 |

වෙනත් ආදායම් (රු. 000)

ලද වට්ටම් 1000

වියදම් (රු. 000)

| | | | |
|---|---|---|---|
| දුන් වට්ටම් | 1500 | වත්කම් ක්ෂය | 3000 |
| වෙනත් වියදම් | 4000 | මෙහෙයුම් වියදම් | 16500 |
| බොල් ණය | 700 | | |

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය

(රු. 000)

| | | |
|---|---|---|
| විකුණුම් | | 107100 |
| අඩු :- විකුණුම් පිරිවැය | | |
| 2018.04.01 දිනට තොගය | 12000 | |
| එකතු කළා ගැනුම් | 75400 | |
| | 87400 | |
| අඩු කළා 2019.03.31 තොගය | (16000) | |
| | | (71400) |
| දළ ලාභය | | 35 700 |
| එකතු කළා වෙනත් ආදායම් | | 1000 |
| ලද වට්ටම් | | 36700 |
| අඩු කළා | | |
| මෙහෙයුම් වියදම් | 16500 | |
| වෙනත් වියදම් | 4000 | |
| දුන් වට්ටම් | 1500 | |
| බොල් ණය | 700 | |
| ස්ථාවර වත්කම් ක්ෂය | 3000 | (25700) |
| ශුද්ධ ලාභය | | 11000 |

2019.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

(රු. 000)

| | | |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | | |
| ස්ථාවර වත්කම් | | 38000 |
| ජංගම වත්කම් | | |
| 2019.03.31 තොගය | 16000 | |
| ණය ගැතියෝ | 15000 | |
| | | 31000 |
| | | 69000 |
| 2018.04.01 ප්‍රාග්ධනය | 40000 | |
| එකතු කළා අමතර ප්‍රාග්ධනය | 5000 | |
| ශුද්ධ ලාභය | 11000 | |
| | 56000 | |
| අඩු කළා ගැනිලි | (8000) | 48000 |
| ජංගම නොවන වගකීම් | | |
| ජංගම වගකීම් | | |
| ණය හිමියෝ | | 18000 |
| බැංකු අයිරාව | | 3000 |
| | | 6900 |

නිදසුන් 03

අජිත්ගේ ව්‍යාපාරයේ පහත තොරතුරු ඔබට සපයා ඇත.

- වත්කම් හා වගකීම් ලේඛනය පහත දැක්වේ.

| අයිතම | රු. 2018/04/01 | රු. 2019/03/31 |
|---|---|---|
| යන්ත්‍ර උපකරණ | 120 000 | 180 000 |
| ලී බඩු සවි කිරීම | 80 000 | 60 000 |
| තොගය | 30 000 | 40 000 |
| ණය ගැතියෝ | 45 000 | 53 000 |
| මුදල් | 15 000 | ? |
| උපචිත මෙහෙයුම් වියදම් | 3 000 | 4 000 |
| ණය හිමියෝ | 27 000 | 18 000 |

අමතර තොරතුරු

- වර්ෂය තුළ රු. 80 000 ක යන්ත්‍රයක් ලබාගත් අතර රු. 10 000 ක ලී බඩු උපකරණ වර්ෂය තුළ රු. 12 000 කට විකුණා ඇත.
- මුදලින් ගෙවූ මෙහෙයුම් වියදම් රු. 17 000 කි.
- වර්ෂය තුළ රු. 50 000 ක බැංකු ණයක් ලබාගෙන රු. 55 000 ක් ගෙවා, එම ණය වර්ෂය තුළ නිදහස් කර ඇත.
- අයිතිකරු විසින් රු. 6000 ක් ලබාගෙන ඇති අතර රු. 15 000 ක අමතර මුදලක් ව්‍යාපාරයට යොදවා ඇත.
- ගිණුම් කාලච්ඡේදය තුළ ගනුදෙනුකරුවනගෙන් රු. 240 000 ක් ලැබී ඇති අතර දුන් වට්ටම් රු. 4000 ක් දී ඇත. කාලච්ඡේදය තුළදී ණය හිමියන්ට මුදල් ගෙවීමේදී රු. 5000 ක වට්ටමක් ලැබුණි.
- පිරිවැයට $33\frac{1}{3}\%$ ක් ලාභ තබාගෙන භාණ්ඩ විකුණා ඇත.

අවශ්‍ය වන්නේ,

✓ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ එදිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

04. තරිඳුගේ ව්‍යාපාරයේ පහත තොරතුරු සැලකිල්ලට ගනිමින් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

(i) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
(ii) 2018.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය
(iii) 2017.04.01 දිනට ප්‍රාග්ධනය

වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| අයිතම | රු. 2017/04/01 | රු. 2018/03/31 |
|---|---|---|
| පරිගණක | 140 000 | 220 000 |
| ලී බඩු | 60 000 | 48 000 |
| භාණ්ඩ තොග | 35 000 | 42 000 |
| ණය ගැතියෝ | 38 000 | 46 000 |
| මුදල් (බැංකු) | 4 000 | ? |
| උපචිත වියදම් | 5 000 | 7 500 |
| ණය හිමියෝ | 23 000 | 19 000 |
| බැංකු ණය | - | 100 000 |

අතිරේක තොරතුරු

1. වර්ෂය තුළ රු. 100 000 ක් වටිනා පරිගණකයක් මිලට ගෙන ඇත.
2. වර්ෂය තුළ රු. 8000 ක් වටිනා ලී බඩු රු. 10 000 කට විකුණා ඇත.
3. වර්ෂය තුළ මෙහෙයුම් වියදම් රු. 12 000 ක් මුදලින් ගෙවා ඇත.
4. වර්ෂය තුළ ණයගැතියන්ගෙන් රු. 257 000 ක් මුදල් ලැබී ඇත. ඔවුන්ට රු. 3000 ක් වට්ටමක් ලබා දී ඇත.
5. වර්ෂය තුළ ණය හිමියන්ට මුදල් ගෙවීමේදී රු. 8000 ක වට්ටමක් ලැබී ඇත.
6. බැංකු ණය ලබාගෙන ඇත්තේ 2016.12.31 දිනය ඒ සඳහා 12% ක වාර්ෂික පොලියක් අය කරයි.
7. තරිඳු විසින් මෙම වර්ෂයේ රු. 5000 ක භාණ්ඩ සහ මුදලින් රු. 10 000 ක් පුද්ගලික ආයෝජනයට ගෙන ඇත.
8. මෙම ව්‍යාපාරය පිරිවැයට $33\frac{1}{3}\%$ ක් ලාභ තබාගෙන භාණ්ඩ විකුණයි.